**රත්මලාන / මොරටුව අපජල අපහරණ පියවර 01 අදියර 02 ව්‍යාපෘතිය - 2022**

**-----------------------------------------------------------------------------------------**

රත්මලාන / මොරටුව අපහරණ පියවර 01 අදියර 02 ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන ආයතනය (Agence Francaise De Development) අතර 2019 පෙබරවාරි 18 දින එළඹි අංක සීඑල්කේ 1023 – 01 එල් දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 (ජේ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුමට අනුව ජල සම්පාදන අමාත්‍යාංශය, දැනට ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

රත්මලාන නේවාසිකයන් (පදිංචිකරුවන් 95,000) සහ මොරටුව නේවාසිකයන් (පදිංචිකරුවන් 167,000 ක් ) සඳහා මලාපවහන සේවා ප්‍රවේශය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මලාපවහන එකතු කිරීමේ ජාලය පුළුල් කිරීම, නව පොම්පාගාර ඉදිකිරීම සහ පවතින පොම්පාගාර සහ පවිත්‍රාගාරය වෙනස් කිරීම, අභ්‍යන්තර දේපල සම්බන්ධ කිරීම, ඉදිකිරීම් සහ අධීක්ෂණ උපදේශනය යන අංග 04 යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ.

ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,682.36 කට සමාන යූරෝ මිලියන 105.5 ක් වන අතර ඉන් රු.මිලියන 15,414 කට සමාන යූරෝ මිලියන 75 ක් ණයක් වශයෙන් මූල්‍යයනය කිරීමට ප්‍රංශ සංවර්ධන ආයතනය එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 6,268.36 කට සමාන යූරෝ මිලියන 30.5 ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2024 දෙසැම්බර් වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මඟින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය හා සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| අංක 01/2019 කළමනාකරණ චක්‍රලේඛයේ 9.3 වගන්තිය. | චක්‍රලේඛ ප්‍රකාරව මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු වුවත් 2019 සිට 2022 දක්වා කාලය සඳහා එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | කොරෝනා වසංගත කාලසීමාව හේතුවෙන් රැස්වීම් පැවැත්වීම සිදු නොවුනි. නමුත් NSC රැස්වීම් නොපැවැත්වුවද, අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විණි. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ශ්‍රී ලංකා රජය ණය ආපසු ගෙවීම කල්දැමීම හේතුවෙන් මහා පරිමාණ ව්‍යාපෘති ප්‍රතිව්‍යුහගත කිරීම සහ වේගවත් කිරීම පිළිබඳ නිලධාරී කමිටුව (RAMP) විසින් නැවත දැනුම් දෙන තුරු ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව නවතා දැමීමට නිර්දේශ කර ඇත. ඒ අනුව විකල්ප වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර එම වැඩසටහනේ ප්‍රගතිය පහත පරිදි වේ.

| | ව්‍යාපෘති සංරචකය | විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මලාපවහන එකතු කිරීමේ ජාලය පුළුල් කිරීම. | මෙම සංරචකය සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2021 දෙසැම්බර් මාසයේදී අත්සන් කරන ලද අතර බලමුලු ගැන්වීමේ අත්තිකාරම් ලෙස රුපියල් මිලියන 1,427 ක් ගෙවා ඇත. කෙසේ වෙතත්, ණය නිකුත් කිරීම අත්හිටුවීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකළ අතර දැනට ක්‍රියාත්මක වන පොම්පාගාර ආශ්‍රිත ක්‍රියාකාරකම් නවයක් තෝරාගෙන කොන්ත්‍රාත්කරුට ගෙවන ලද අත්තිකාරම් මුදල පියවා ගැනීමේ සංශෝධන වැඩසටහනක් සකස් කරන ලදී. තවද, කොන්ත්‍රාත්කරු රු. මිලියන 1,427 ක්වූ අත්තිකාරම් මුදල අපේක්ෂිත ප්‍රගතියක් නොමැතිව මාස 12ක කාලයක් රඳවා ගෙන තිබුණි. | බලමුලු ගැන්වීම, රක්ෂණ සහ කාර්යසාධන බැඳුම්කර වැනි පූර්ව ඉදිකිරීම් කාර්යයන් අවසන් කිරීමෙන් පසු 2022.05.12 වන දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. ඉදිකිරීම් කටයුතු වල පවත්නා වූ මන්දගාමී ප්‍රගතිය සඳහා ප්‍රධාන වශයෙන් ආර්ථික අර්බුදකාරී තත්ත්වයන් හේතු වී තිබේ. | කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව අධීක්ෂණය කළ යුතු අතර සංශෝධිත වැඩ නිම කරවා ගෙන අත්තිකාරම් මුදල වහාම අයකර ගත යුතුය. |
| ( ආ ) | නව පොම්පාගාර ඉදිකිරීම සහ දැනට පවතින පොම්පාගාරය සහ පවිත්‍රාගාරය වෙනස් කිරීම | සියලුම ණය වාරික භාවිතා කිරීම (drawdown) 2024 දෙසැම්බර් 31 හෝ ඊට පෙර අවසන් කළ යුතු වුවද, කොන්ත්‍රාත්තුව 2023 පෙබරවාරි 28 දක්වා ප්‍රදානය කර නොතිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ ලංසු අයදුම්පත් ඇගයීම | 2022 ජනවාරි මාසයේදී තාක්ෂණික ඇගැයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව පත් කරන ලදී. තාක්ෂණික ඇගැයීම් කමිටු වාර්තාව 2022 අප්‍රේල් මාසයේදී අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී. 2022 ජූලි 29 දින සිට බලපැවැත්වෙන පරිදි රජය විසින් ණය ආපසු ගෙවීම අත්හිටුවීම හේතුවෙන් ප්‍රංශ සංවර්ධන | භාණ්ඩාගාරයෙන් මූල්‍ය අනුග්‍රහය ලබාගෙන අපේක්ෂිත ව්‍යාපෘති කටයුතු සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පමණක් අවසන් කර තිබුණි. | නියෝජ්‍යායතනය (AFD) ණය ලබා දීම තාවකාලිකව අත්හිටුවා ඇති බැවින්, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසු ලේඛන කැඳවීම අනුමත නොකළේය. | |
| (ඇ) | ඉදිකිරීම් සහ අධීක්ෂණ උපදේශනය | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් 2023 පෙබරවාරි 15 දින වන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. | ලංසු ඇගයීම සිදු වෙමින් පවතී. නව අමාත්‍යවරයා පත් කල නිලධාරීන් විශ්‍රාම යාමෙන් පසු අමාත්‍යාංශ ලේකම්වරයා වෙනස් කිරීම හේතුවෙන් CPCC සාමාජිකයින් කිහිප දෙනෙකු නැවත පත් කිරීමට නියමිතයි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතු අතර අමාත්‍යාංශ නිලධාරීන්ගේ වෙනස්වීම් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සැලකිය යුතු ප්‍රමාදයකට හේතුවක් නොවිය යුතුය. |
| (ඈ ) | ඉඩම් අත්පත් කර ගැනීම | ව්‍යාපෘතියේ මූලික අදියරේදී ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කළ යුතු වුවද අපජල පොම්පාගාර ඉදිකිරීම සඳහා අවශ්‍ය වූ ඉඩම් කට්ටි හයක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් පවරාගෙන නොතිබුණි. | 2016 ජූලි මාසයේ සිට පොම්පාගාර 07ක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ආරම්භ කරන ලද අතර මහජනතාවගේ සහ ඉඩම් හිමියන්ගේ විරෝධතා, මිනින්දෝරු සැලසුම් ලබා ගැනීමේ ප්‍රමාදය, අමාත්‍යවරුන් සහ අමාත්‍යාංශවල නිතර වෙනස්වීම්, සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් කලින් වෙන්කර ගැනීම වැනි මෙම ක්‍රියාවලියේ ආවේනික ප්‍රමාදයන් හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී වේ. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ උපදේශන සේවා මාර්ගෝපදේශයන්ට අනුව මලාපවහන ආවරණ ජාලය පුළුල් කිරීමේ පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ කොන්ත්‍රාත්තුව මොරටුව විශ්වවිද්‍යාලයට ලබා දීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර තිබුණද, ඉහත නිර්දේශය පිළිපැදීමෙන් තොරව ව්‍යාපෘතිය විසින් රු. මිලියන 8 ක් වූ එම කොන්ත්‍රාත්තුව සීමිත පුද්ගලික සමාගමකට ලබා දී තිබුණි. | ලංසු ආරාධනා ලිපිය 2017 නොවැම්බර් 16 වන දින මොරටුව විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවට යවන ලද නමුත් 2017 දෙසැම්බර් 5 වන දින ලංසු අවසන් කිරීමට පෙර ඊට කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොතිබුණි. ප්‍රකාශයට පත් කරන ලද තාක්ෂණික මාර්ගෝපදේශ / EIAR සඳහා ලියාපදිංචි කරන ලද උපදේශන සේවා ආයතන ලැයිස්තුවට අනුව මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් මොරටුව විශ්වවිද්‍යාලය යටතේ යුනි-උපදේශන සේවා යන නාමය ද ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් පිළිපැදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2016 වර්ෂයේ ආරම්භ කර තිබූ ව්‍යාපෘති කාර්යාලය 2016 වසරේ සිට නිලධාරීන් 20 දෙනෙකු පමණ එහි සේවය කර ඇතත්, ව්‍යාපෘති යටතේ එක් කොන්ත්‍රාත්තුවක් පමණක් ලබා දී ඇති අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අනෙකුත් සංරචක සඳහා කොන්ත්‍රාත්තු ලබා දී නොමැත. 2016 වසරේ සිට ව්‍යාපෘති කාර්යාලය නඩත්තු කිරීම සඳහා රුපියල් මිලියන 227ක් වැය කර ඇති අතර නිලධාරීන්ගේ දුර්වල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පූර්ව ගිවිසුම් කටයුතු පමණක් සිදු කර ඇති අතර 2022 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. එබැවින්, සැබෑ භෞතික ප්‍රගතිය සැපයිය හැක්කේ 2022 සිට කොන්ත්‍රාත්කරු බලමුලු ගැන්වීමෙන් පසුව පමණි. තවද උපදේශක යටතේ මෙවැනි මහා පරිමාණ මලාපවහන ව්‍යාපෘතියක් සඳහා සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුමක් සිදු කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකක කාර්ය මණ්ඩලයට සහ උපදේශකයින්ට අධික වියදමක් දැරීමට සිදුවේ. ඉහළ කාර්ය සාධනයක් සහිත ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට කාර්ය මණ්ඩලයක් සිටීමේ ප්‍රතිඵලයක් ලෙස, ඉහළ වැටුප් ලබන තාක්ෂණික විශේෂඥයින්ගේ මග පෙන්වීමකින් තොරව ව්‍යාපෘතියට මෙම ඉලක්කය සපුරා ගත හැකිය. | ව්‍යාපෘති නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමට හා නිසි ඇගයීම සඳහා නව කාර්යසාධන දර්ශක ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 සම්පත් ඌන උපයෝජනය**

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා උපයෝජනය නොකළ ණය ශේෂය මත බැඳීම් ගාස්තු ලෙස රු.මි. 248ක් මහා භාණ්ඩාගාරය විසින් ගෙවා තිබුණි. | ණය ගිවිසුමට අනුව ණය දෙන්නා සඳහා බැඳීම් ගාස්තු ගෙවීමට රජය බැඳී සිටී. මේ සම්බන්ධයෙන් කිසිදු වාර්තාවක් අපට නොලැබෙන බැවින් නිරවද්‍යතාව පැහැදිලි කිරීම සඳහා බැඳීම් ගාස්තු, පොලී ගාස්තු සහ තක්සේරු ගාස්තු අපි ERD වෙත යොමු කර ඇත. | අරමුදල නියමිත ණය බෙදාහැරීමේ සැලැස්ම (disbursement plan) ලෙස භාවිතා කිරීමට සහ බැඳීම් ගාස්තු අවම කිරීමට කටයුතු කළ යුතුය. |